**www.wsws.org**

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු ස්ටැලින්වාදී නායකයෝ කොංග්‍රසය සහ දක්ෂිනාංශික ප්‍රාන්තීය පක්ෂ සමග සන්ධානයන් ආරක්ෂා කරති

**Indian Stalinist leader defends alliances with Congress and rightwing regional parties**

**දීපාල් ජයසේකර සහ අරුන් කුමාර් විසිනි.**

**2009 මැයි 20**

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) මාධ්‍යවේදීන් වන දීපාල් ජයසේකර සහ අරුන් කුමාර් මැයි 11 වන දින චෙන්නායිහි පිහිටි තමිල්නාඩු ප්‍රාන්ත කොමිටි කාර්යාලය තුල ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) නොහොත් සීපීඑම් මධ්‍යම කාරක සභික ඒ.කේ. පද්මනාභන් සම්මුඛ පරීක්ෂනයකට භාජනය කලහ.

පාර්ලිමේන්තු බහුතරයක් සහිත වාම පෙරමුනේ (එල්.එෆ්) ප්‍රධාන පක්ෂය වන සී.පී.එම් පක්ෂය 2004 මැයි සිට 2008 ජූනි දක්වා කොංග්‍රස් පක්ෂය මෙහෙය වූ එක්සත් ප්‍රගතිශීලි සන්ධාන (යූපීඑෆ්) ආන්ඩුවට සහය දුන්නේ ය. 'භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) නොවන, කොංග්‍රස් නොවන', 'අනාගමික' සහ 'ජනතා හිතැති' ආන්ඩුවක් සඳහා පදනමක් පවතියි යනුවෙන් කියාපාමින් කොංග්‍රසයේ හෝ හින්දු ස්වෝත්තමවාදී භාරතීය ජනතා පක්ෂයේ මීට පෙර හවුල් වූ ප්‍රාදේශීය සහ කුල මත පදනම් වූ පක්ෂවලින් සමන්විත වූ තුන්වන පෙරමුන (ටීඑෆ්) පිහිටුවීමෙහි ලා, මෑතදී ඉන්දියාවේ නිමා වූ මහා මැතිවරනයේ දී වාම පෙරමුනට ආධාර කලේ ය.

පද්මනාභන් සමග පැවැත් වූ සම්මුඛ පරීක්ෂනයක සංස්කරනය කරන ලද පිටපත පහත දැක්වේ. "Communist Party of India (Marxist): a key prop of Indian bourgeois rule" යන ලිපියේ ජයසේකර හා කුමාර්ගේ (ඉංග්‍රීසි) පිලිතුර සොයාගත හැක. වාම පෙරමුන ලද දරුනු පරාජය ඇතුලු ඉන්දියානු මැතිවරනයේ විශ්ලේෂනයක් සඳහා, India: Re-elected Congress-led government to accelerate pace of pro-investor "reforms".) නමැති (ඉංග්‍රීසි) ලිපිය කියවන්න.

ලෝ.ස.වෙ.අ : සීපීඑම් සහ වාම පෙරමුන පැත්තෙන් බැලූ කල මෙම මැතිවරනයේ කේන්ද්‍රීය කාරනා මොනවාද?

පද්මානභන් : මෙම මැතිවරනය ඉන්දියානු දේශපාලනයේ වැදගත් අවධියකි. සීපීඑම් පැත්තෙන් බැලූ කල, අපි වඩා වැදගත් කාරනා තුනක් මතු කරමු. එක් ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ ඉන්දියානුවන් වන අප මුහුන දී ඇති වාර්ගික බෙදීමයි. රටේ විවිධ ප්‍රදේශවල දක්ෂිනාංශික සහ මූලධර්මවාදී බලවේග ක්‍රියාත්මක වෙති. ඔවුහු හින්දු මූලධර්මවාදීන් සහ මුස්ලිම් මූලධර්මවාදීන් වෙති. ඔවුහු ඉන්දියානු අනාගමික ව්‍යුහයට ඉමහත් තර්ජනයකි. මෙම තර්ජන ඉන්දියානු දේශසීමාවන්ට පමනක් සීමා නොවෙයි. මේවා දේශසීමාවන්ට පිටතින් පවා පැමිනෙති. ... අප මහජනයාට පවසන්නේ ජාති භේද වාදය වනාහි පරාජය කල යුතු අති මහත් තර්ජනය ක් බව ය.

ඊලඟ වැදගත් කාරනාව වන්නේ ආර්ථික ප්‍රතිපත්තිය යි. ආර්ථික ප්‍රතිපත්තිය පැත්තෙන් ගත් කල, වසර 20 ක් පුරා ලිබරල් ප්‍රතිපත්ති එනම් ඊනියා භූගෝලීකරන ප්‍රතිපත්ත සමග පොරබදා ඇත. 1991 සිට ඉන්දියාව පාලනය කරනු ලැබූ ඕනෑම ආන්ඩුවක්, කොංග්‍රසය මෙහෙය වනු ලැබූ ආන්ඩුවක් වේවා, බීජේපී මෙහෙය වනු ලැබූ ආන්ඩුවක් වේවා, සුලු වෙනස්කම් සහිතව සමාන වර්ගයේ ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කලහ. ගොවි ජනතාව වේවා කම්කරුවන්, සුලු වෙලෙන්දන්, සුලු කම්හල් කරුවන්, තරුනයන් සහ ශිෂ්‍යයන් වේවා, සෑම අංශයකම වැඩ කරන ජනතාව ගොදුරු කෙරුනු මහා විනාශය, මෙම ජනතා විරෝධී ප්‍රතිපත්ති මගින් නිර්මානය කර ඇත. සෞඛ්‍ය සහ පරිසර අංශ, බලශක්ති ක්ෂේත්‍ර සහ බොහෝ කර්මාන්ත අංශවල මහා විනාශයක් මෙම ප්‍රතිපත්ති නිර්මානය කර ඇත...

මැතිවරන කාලයේ පමනක් නොව පසුගිය වසර 20 පුරා අඛන්ඩව මෙම ප්‍රතිපත්තිවලට එරෙහිව අපි අරගලය කර ඇත්තෙමු. අපි මහජනතාවට පවසන්නේ ජාතිවාදී බලවේග පරාජය කල යුතු බව යි. ආන්ඩු

ප්‍රතිපත්ති වෙනස් කල යුතුව ඇත. මෙම ප්‍රතිපත්ති එනම් කොංග්‍රසය සහ බීජේපී මෙහෙයවන වර්ගභේදවාදී සහ ජනතා විරෝධි ආර්ථික ප්‍රතිපත්ති, යන පෙරමුනු දෙකම පරාජය කල යුතු ය.

තෙවන කාරනාව වන්නේ ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක් සඳහා ඇති අවශ්‍යතාවය යි. රටේ බොහෝ අනෙකුත් පක්ෂ මෙම කාරනාව අවාසනාවකට ඉස්මතු නොකලත් අපි සලකන්නේ මෙම කාරනාව වැදගත් බව ය. ඉන්දියාව නොබැඳි ව්‍යාපාරයේ ත්, විවිධ විමුක්ති අරගලවල සහායකයෙක් ලෙස එනම් අධිරාජ්‍යවාදී උපාමාරුවලට එරෙහි රටක් ලෙසත් පිලිගැනේ. එහෙත් අවාසනාවකට පසුගිය වසර කිහිපය පුරාම, දකුනට ගමන් කර ඇති ඉන්දියාව තමන් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ සහායකයකු බව ප්‍රකාශ කලේ ය. අපට මෙය ආපසු හැරවීමට අවශ්‍යය ය.

මෙයට අමතරව, සමාජ සාධාරනත්වය සහ මධ්‍යම ආන්ඩු ප්‍රාන්ත ආන්ඩු සබඳතා වැනි අනෙකුත් කාරනාද පවතී. අනෙකුත් පක්ෂ සමග මෙම කාරනා ගැන සමහර වෙනස්කම් තිබිය හැකි වුවද සාමාන්‍යයෙන් වම සහ තුන්වන පෙරමුනේ එහි මිත්‍ර පාක්ෂිකයෝ සහකරුවෝ කොංග්‍රස් නොවන, සහ බීජේපී නොවන ආන්ඩුවක් සඳහා පෙනී සිටිති, එනම් නව ප්‍රතිපත්ති මාලාවක් සහිත විකල්ප අනාගාමික ආන්ඩුවක් සඳහා ය. අප පවසන්නේ නැහැ එය වම මෙහෙයවන ආන්ඩුවක් විය යුතු යි කියල. අනාගාමික ආන්ඩුවක පදනම ගොඩනැගීමට විකල්ප ප්‍රතිපත්තීන් වර්ධනය කිරීම සඳහා අප වැඩ කරමින් සිටිමු.

ලෝසවෙඅ. සීපීඑම් කොංග්‍රස් මෙහෙය වූ ආන්ඩුවට අවුරුදු හතරක් සහය දුන්නා. එය ඉන්දු ඇමෙරිකා තාප න්‍යෂ්ටික ගනුදෙනුව මත පසුගිය වසරේ සහය දීම නැවැත්වී ය. වම සමග කොංග්‍රසය ඇති කරගෙන තිබුනු එකගතාව පාවාදීම ගැන ඔබ කොංග්‍රසයට දෝශාරෝපන ය කලා. ඔබ තවමත් හිතනවද කොංග්‍රසයට සහය දීමේ වාම පෙරමුනේ ප්‍රතිපත්තිය සාර්ථක වෙයි කියල?

පද්මනාභන් : එය උපායික තීරනයකි. අපි 2004 මැතිවරනයේ දී කොංග්‍රස් ආන්ඩුවක් සඳහා හෝ කොංග්‍රස් මෙහෙයවන ආන්ඩුවකට කැඳවුම් කලේ නැහැ. අප කැඳවුම් කලේ බීජේපී බලයේ සිටි නිසා ඔවුන් පරාජය කිරීමටත් අනාගමික ආන්ඩුවක් ගොඩ නැගීමටත්ය. මෙම මාවත් දිගේ අපි (2004) 14 වන ලෝක් සභා මැතිවරනවල දී උද්ඝෝෂන කලෙමු.

ඒ කෙසේ වෙතත්, බීජේපී මෙහෙයවන ආන්ඩුවක් හෝ කොංග්‍රසය මෙහෙවන ආන්ඩුවක් ද යන ප්‍රශ්නය මුන ගැසුනු විට, කොංග්‍රසය කරන්නෙ කුමක් ද යන්න නොදැන නොවේ. ඉන්දියාවේ ඕනෑම අනාගමික පුද්ගලයකු කොංග්‍රස් ආන්ඩුවක් තෝරා ගනියි.

2004 දී වම ආසන 61 ජය ගත්හ. එයින් මන්ත්‍රීවරු 54 ක් කොංග්‍රසයේ අපේක්ෂකයින් පරාජය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූහ. එවිට අප තීරනය කලේ කොංග්‍රසය මෙහෙයවන ආන්ඩුවකට සහය දෙන ලෙස ය. අප අපගේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලෙස ආන්ඩුවට පැවසුවේ නැහැ. අප ආන්ඩුවට පැවසුවේ තම පොදු අවම වැඩපිලිවෙල ක්‍රියාත්මක කරන ලෙස ය.

ඊලග වසර හතර පුරා, සීපීඑම් සහ වාම පෙරමුන ප්‍රතිපත්ති කාරනා ගැන අරගලයේ ඉදිරියේ සිටියා. පාර්ලිමේන්තුව අභ්‍යන්තරයේ වේවා, පිටස්තරයේ වේවා අපි මූලිකත්වය ගත්තා. බීජේපී නිල විරුද්ධ පක්ෂය විය. ... එහෙත්, ඔවුහු කවදාවත් මූලික ප්‍රතිපත්ති කාරනා සැලකුවේ නැත. අප ආන්ඩුවට සහය දුන්න ද මේවා (ප්‍රතිපත්ති කාරනා) මතු කලේ වම පමන ය.

ඒ සමගම මහජනතාවට දෙන ලද සමහර සහතික ක්‍රියාත්මක කරන ලෙස අපි ආන්ඩුවට බල කලෙමු. සමහර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ත් සමහර ප්‍රතිපත්ති නැවැත්වීමට ත් අප සමත් වුනා.

අප පැහැදිලි කලේ සිවිල් න්‍යෂ්ටික ගිවිසුම අත්සන් කිරීම තුලින් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මිත්‍ර පාක්ෂයකු බවට ආන්ඩුව ඇද උරාගනු ලබන බව ය. අපට අවශ්‍ය වුනේ නැහැ වමේ සහය සමග ආන්ඩුව සිවිල් න්‍යෂ්ටික ගිවිසුම වැන්නක් අත්සන් කිරීම. එය තමයි අවසානය.

අප කුමක් කර ඇතත්, අප උචිත වේලාවට එය කලෙමු. අප කොංග්‍රසය හා (යූපීඒ) සමග නිවැරදි වේලාවට සබඳතා බිඳ දැම්මා. මහජනතාව තේරුම් ගන්නවා ඇත. අප මහජනතාවට පැවසුවා සිවිල් න්‍යෂ්ටික ගිවිසුමට අප විරුද්ධ බවත්, එයට හා සාමූහික ඉන්දු ඇමරිකානු හමුදා ව්‍යායාම වලට එරෙහිව, අප බොහෝ ජාතික උද්ඝෝෂන කරන ලද බවත්. චෙන්නායි සිට විසාකාපත්නම් දක්වා අපි විරෝධතා පෙලපාලි සංවිධානය කලෙමු. කලගුන්ඩා හි බටහිර බෙංගාලයේ ලක්ෂ සංඛ්‍යාත මහ ජනතාව අපි බලමුලු ගැන්වූවෙමු.

කොංග්‍රසය කරන්න යන්නේ කුමක් ද යන්න අප දැනගෙනයි හිටියේ. එහෙත් පසුගිය මැතිවරනය තුල වෙන කිසිවක් කිරීමට නොහැකි වුනා. දැන් මෙම මැතිවරනය තුල බීජේපී සහ කොංග්‍රසය යන දෙකටම විරුද්ධ පක්ෂ බලමුලු ගැන්වීමට අවකාශය මතුවී තිබෙනවා. මෙය සිතෙහි තබාගෙන අප දකිනවා විකල්ප ආන්ඩුවක් ගොඩ නැගීම සඳහා කොංග්‍රසය සහ බීජේපී යන දෙකටම එරෙහි සමහර දේශපාලන පක්ෂ බලමුලු ගැන්වීමට 15 වන ලෝක් සභා මැතිවරනය අවස්ථාවක්

කර ගත හැකි බව. කොංග්‍රසයටත් බීජේපීයටත් එරෙහිව සටන් කිරීමට සූදානම් ප්‍රබල දේශපාලන පක්ෂ දැන් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රාන්ත කිහිපයකම පවතී.

විකල්ප ආන්ඩුවක් පිලිබඳව සීපීඑම් හි සංකල්පය වෙනස් එකකි. එහෙත් වත්මන් තත්ත්වය තුල අප දකින්නේ කල හැකි කුමක්ද අපගේ එල්ලය දිශාවට උපකාරී වන්නේ කුමක් ද යන්නය.

ලෝසවෙඅඃ මැතිවරනයෙන් පසුව කොංග්‍රසය මෙහෙයවන ආන්ඩුවකට සහ දීම ගැන, සීපීඑම් ප්‍රධාන ලේකම් ප්‍රකාශ් කරත් සහ ජ්‍යෙෂ්ඨ පක්ෂ නායක සීතාරාම් යෙචුරි මුලුමනින්ම බැහැර කර නැහැ. ඔවුහු පවසා ඇත්තේ, "අපි මැයි 16 න් (එනම් ප්‍රතිපල නිකුත් වීමෙන්) පසුව තීරනය කරන්නෙමු " යනුවෙනි. එසේනම් පක්ෂයේ නිල ආස්ථානය කුමක් ද?

පද්මනාභන් : කරත් සහ යෙචුරි එය ප්‍රතික්ෂේප කලා. නමුත් ජන මාධ්‍යයන් දිගටම ඉල්ලීම් කලා. ඉතින්, කරත් පැවසුවේ මැයි 16 වන තුරු බලා සිටිමු කියලයි. සෑම දෙයක්ම රඳා පවතින්නේ ප්‍රතිඵල මතයි. අපට ඉතාමත්ම පැහැදිලියි අප අරගලය කරන්නේ නව ආන්ඩුවක් ගොඩ නැගීමට කියල. අපට තවමත් දැනෙනවා විකල්ප ආන්ඩුවක් ගොඩ නැගෙයි කියල මහ ජනතාව වෙනත් දෙයක් සඳහා තීරනය කරයි නම් එය ඔවුන්ගේ ප්‍රාර්ථනාවයි.

ලොසවෙඅඃ සීපීඑම් පවසන්නේ තුන්වන පෙරමුන අනාගමික ජනතාවාදී ආන්ඩුවක් සම්පාදනය කරන බව යි. නමුත් එහි සංයුතිය දෙස බලන්න ටීඩීපී, ඒඅයිඒඩීඑම්කේ, බී.ජේ.ඩී මේ සියල්ලෝම බීජේපී මෙහෙය වූ ආන්ඩුවලට හවුල් වුනා.

පද්මනාභන් ඃ වම හැර, ඉන්දියාවේ සියලුම ප්‍රාන්ත දේශපාලන පක්ෂ, විවිධ අවස්ථාවල දීත්, විවිධ කාල වලදීත් බීජේපී හෝ කොන්ග්‍රස් මෙහෙයවන ලද සන්ධානවලට හවුල් වී ඇත. තමිල්නාඩුවේ පදනම් වූ ප්‍රධාන පක්ෂ දෙකම, එනම් ඩීඑම්කේ සහ ඒඅයිඒඩීඑම්කේ විවිධ කාල වලදී බීජේපී මෙහෙයවන ලද ආන්ඩුවලට හවුල් වී ඇත. ඩීඑම්කේ වසර හතරක් පුරා බීජේපී මෙහෙය වූ ආන්ඩුවේ සිටිය. ඒඅයිඒඩීඑම්කේ පක්ෂ නායිකාව ජයලලිතා පවසන්නේ ඇය කොන්ග්‍රසය සහ බීජේපී යන දෙකටම එරෙහි අරගලය කිරීමට සූදානම් බව නම් අපි එය පිලිගනිමු. ඔවුන්ට තමන්ගේ ම අත්දැකීම් ඇත.

ලෝක බැංකු ප්‍රතිපත්ති සෘජුව ඉදිරිපත් කල ටී.ඩී.පී. නායක (චන්ද්‍ර බාබු නයිඩු) දැන් විවෘතව තමන් වැරදි බව පවසයි. පෙරාතුව බීජේපී සන්ධානයට හවුල් වූ ඔහු දැන් බීජේපී ට එරෙහි සටන් වදිමින් සිටියි. අපි එය පිලිගන්නෙමු. මහජනතාව අත්දැකීම් තුලින් පාඩම් උගනිති. සමහර විට ඔවුහු වෙනස් වෙති. සමහර විට වෙනස් නොවෙති. අප පෙනී සිටින්නේ වෙනසක් සඳහා යි. අපට වෙනසේ උත්තේජකයකු වීමට අවශ්‍යය ය.

අනෙකුත් සියලුම පක්ෂ වැරදි නිසා ඉවත් කල යුතු යයි වම පවසන්නේ නම්, එයින් පලක් විය හැකි ද? වම තනිවම පෙනී සිටියි. මෙය උපකාරී වන්නේ ජාතිවාදී බලවේගවලට ය. එය ජනතා විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පමනක් උපකාරී වෙයි.

මෙම පක්ෂ කොන්ග්‍රසය සහ බීජේපී ට එරෙහිව සටන් කිරීමට සූදානම් නම් අප එය පිලිගන්නෙමු. ඩීඑම්කේ සහ ඒඅයිඒඩීඑම්කේ ජාතිවාදී පක්ෂ ලෙස අපි නොසලකමු. ඉන්දියාවේ තත්වය කෙසේ ද යත් මන්ත්‍රීවරයකු පමනක් ඉන්නා පක්ෂයකට පවා මධ්‍යම ආන්ඩුවට බලපෑමක් කල හැක. "නැත, පසුගිය වසරේ ඔබ මෙය කල නිසා ඔබ සමග කිසිදෙයක් කිරීමට අප සූදානම් නැතැ" යි පැවසීමෙන් කිසිදු පලක් නැත.

අපගේ සීමාවන් අපි දන්නෙමු. අපි ප්‍රාන්ත තුනක බලයේ සිටින්නෙමු. වෛෂයික කොන්දේසි සඳහා මනාව අවධානය යොමු කල යුතුවේ.

අප මනාව පැහැදිලි කලේ දැන් (බීජේපී මෙහෙයවන) එන්.ඩී.ඒ. සහ (කොන්ග්‍රසය මෙහෙයවන) යූ.පී.ඒ. හි පෙල ගැසී ඇති ප්‍රජාතන්ත්‍රවාදී බලවේග බලමුලු ගැන්විය හැකි බව ය.

ලෝසවෙඅඃ බටහිර බෙංගාලයේ හිටපු මහ ඇමති ජෝති බාසු සහ වත්මන් මහ ඇමැති බුද්ධාදෙබ් බට්ටාචාර්ජි වැනි ජ්‍යෙෂ්ඨ මකොප නායකයෝ පවසා ඇත්තේ සමාජවාදය දැනට න්‍යාය පත්‍රයේ නැති බව යි. බාසු පවසා ඇත්තේ "සමාජවාදය වනාහි බොහෝ ඈත පවත්නා දෙයක" යනුවෙනි. අද පවත්නා සමාජවාදය සඳහා අරගලය ඔබ දකින්නේ කෙසේද?

පද්මනාභන් ඃ සමාජවාදය සඳහා අරගලය සහ න්‍යාය පත්‍රයේ සමාජවාදය වෙනස් කාරනා වෙයි. අපගේ පක්ෂ වැඩ පිලිවෙලෙහි අප පවසා ඇත්තේ එය අපගේ මූලෝපායික එල්ලය බව යි. එල්ලය වෙත අප මෙහෙයවනු ලබන මහජන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් සඳහා අපි වැඩ කරන්නෙමු. දැන් වන විටත් මහජන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පවා න්‍යාය පත්‍රයේ නැත. මේ පිලිබඳව කිසිදු ව්‍යාකූලත්වයක් නැත. අප එවැනි තත්වයකට පවා එලඹී නැත.

සමාජවාදය න්‍යාය පත්‍රයේ ඇති බව පැවසිය හැක්කේ කාට ද? අප දැන් ඉන්නේ කොහේද? කම්කරු පන්තියේ කුඩා කන්ඩායමක් පමනක් සංවිධාන ගත වී ඇත. කෙනෙකුට අවධීන් උඩින් පැනිය නොහැක.

මිනිසුන් එක රැයකින් වෙනස් වෙතැයි සමහරු සිතූහ. එවැනි මනඃකල්පිත දේවල් ඉන්දියානු වාමාංශික ව්‍යාපාරයට ඇති තරම් විනාශයක් ගෙන දී ඇත. ඔවුහු ආයුධ අතට ගත්හ. පවතින තත්වය මනාව අවබෝධ කර ගත යුතු ය කෙනෙකුට තමාගේ එල්ලය සඳහා වැඩ කල යුතුව ඇත. ඒ අතරතුර, ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගෙන් ලබා ගත හැකි ආධාරය ලබා ගත යුතු ය. වෙනත් විකල්පයක් නැත. අප අපගේ පක්ෂ වැඩ පිලිවෙලේ පැහැදිලිව පවසා ඇත. එනම් එන්.ඩී.ඒ. හෝ යූ.පී.ඒ. සමග ඇති ප්‍රජාතන්ත්‍රවාදී බලවේග බලමුලු ගැන්විය යුතු බව යි.

කම්කරුවෝ කොපමන සංඛ්‍යාවක් සමිති වල සංවිධාන ගත වී සිටිති ද? ඉන්දියාවේ දැන් පවතින තත්වය කුමක් ද? පූර්ව ධනවාදී අවධියේ පවතින සමහර ප්‍රදේශ තවමත් පවතී.

1957 දී පවා, සීපීඅයි නායක (සහ පසුව සීපීඑම් පුරෝගාමියා) ඊ.එම්.එස්. නම්බුදිබාද් කේරල කාර්යාලයේ දිවුරුම් දීමෙන් පසු දින පුවත්පත් වලට පැවසුවේ, "අප බලාපොරොත්තු වන්නේ සමාජවාදය න්‍යාය පත්‍රයේ නොමැති ආන්ඩුවක් ගොඩ නැගීමටයි." ප්‍රකාශනය තවමත් වලංගුය- ඉන්දියාවේ පමනක් නොව, ඕනෑම තැනක බොලීවියාවේ වේවා අනෙකුත් රටවල් වලත්.

සමාජවාදය යනු මූලෝපායික එල්ලය වෙයි. එය සඳහා දීර්ඝ කාලයක් ගතවෙයි. මහජනතාව ඒ සඳහා අරගල කල යුතුව ඇත. අපට බටහිර බෙංගාලයේත්, කේරලයේත් ලැබුනේ දේශපාලන බලය නොව පරිපාලන බලය වෙයි. දේශපාලන බලය තවමත් ඇත්තේ පාලක පන්තිය සතුවය. ෆෙඩරල් ව්‍යුහය තුල ප්‍රාන්ත ආන්ඩුවලට ප්‍රමානවත් සම්පත් නොපවතියි. භූගෝලීය කරනයේ බලපෑම නිසා ප්‍රශ්න බොහෝමයක් මතු කර පවතී. අරමුදල් සිඳී ඇත. ප්‍රාන්ත ආන්ඩුවලට මූල්‍යමය සීමාවන් පවතින අතර, ඉන්දියා ව්‍යවස්ථාමය සීමාවන් ද පවතී.

ලෝසවෙඅඃ මෑත දී බටහිර බෙංගාලයේ රාජ්‍ය සභා අතුරු මැතිවරනයක දීත්, පලාත් මැතිවරනවල දීත්, එක්සයිඩ්, මිට්සුබිෂි සහ කොල්කටා පෝර්ට් ට්‍රස්ට් ඉන්දියානු වෘත්තීය සමිති ශාඛාවන්හි කොංග්‍රසය සඳහා පැවති මැතිවරනවල දීත් සීපීඑම් සහ වාම පෙරමුනත් මැතිවරන පරාජයන්ට ගොදුරු විය. විශේෂයෙන්ම නන්දිග්‍රම්හි විශේෂ ආර්ථික කලාප සඳහා ඉඩම් ලබාගැනීමට එරෙහිව 2007 ගොවිජන උද්ඝෝෂන මර්දනය කිරීමට පොලීසිය සහ දාමරිකයින් යෙදීම වැනි බටහිර බෙංගාල වාම පෙරමුනේ ආයෝජක ගැති ප්‍රතිපත්ති වලට එරෙහිව මහජන ප්‍රතික්‍රියාවක් මෙය නොවන්නේ ද?

පද්මනාභන් ඃ නැක්සලයිට්වරුන් ද (මාඕවාදී කැරලි කරුවන්), ඊනියා වම ද, සිට දක්ෂිනාංශික සහ ජාතිවාදී බලවේග දක්වා සියල්ලන්ගෙන් සමන්විත සභාගයක් පවතී. මොවුන් සියල්ලෝම වාම පෙරමුනට සතුරු ය. ජර්බන්ද් වල මැතිවරන ප්‍රතික්ෂේප කිරීමට උද්ඝෝෂනය කරන මාඕ වාදීන් පවා බටහිර බෙංගාලයේ කැඳවුම් කරන්නේ වාම පෙරමුන පරාජය කිරීම සඳහා ඡන්දය භාවිතා කරන ලෙස ට ය. අප ඔවුන් සමග දේශපාලනිකව සටන් කරමින් සිටින්නෙමු. ...

බටහිර බෙංගාලයේ ඇති ඇමරිකානු කොන්සියුලේට් කාර්යාලය පවා වම ට එරෙහිව උද්ඝෝෂනය කරමින් සිටින්නේය. එහි බෙංගාලි භාෂාව කථා කරන කොන්සල්වරයකු සිටියි.

ලෝසවෙඅ ඃ තුන්වන පෙරමුනේ ඔබගේ මිත්‍ර පාක්ෂිකයකු වූ තෙලංගන රෂ්ත්‍ර සමිති (ටීආර්එස්) ඊයේ ලුදියානා හි බීජේපී /එන්.ඩී.ඒ රැලියකට සහභාගි විය.

පද්මනාභන් ඃ බලයට එන ඕනෑම කෙනෙකු සමග ටීආර්එස් නායකයා පෙලගැසීමට කේවල් කරයි. මට යන්නට තිබෙනවා මම පැයකටත් වැඩියෙන් කථා කරලයි තියෙන්නෙ.

© www.wsws.org